# අතීත ලංකාවේ තිරසාර සංවර්ධනය හා පාරිසරික සුරක්ෂිතතාවය වත්මනට යොදා ගත හැකි ආකාරය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්

*නවෝදි ජී.ඩබ්ලිව්.ටී.එස් [1]*

ලංකාවේ අතීත පාලකයන් විසින් රට තුළ දේශපාලන,ආර්ථික සහ ආගමික යන සියලු ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරීමෙහි දී පාරිසරික සුරක්ෂිතතාව පිළිබඳ ව මනා අවබෝධයකින් යුතුව කටයුතු සිදුකර තිබේ.නමුත් වර්තමානය වන විට ඉහළ සමාජය ස්ථරය නියෝජනය කරන පාලක පන්තිය විසින් විවිධ ස්වකීය අරමුණු පෙරදැරි කරගෙන රටේ සංවර්ධන ඉතාමත්ම පුළුල් අයුරින් සිදු කළත්,එකී සංවර්ධන ක්‍රියාවලිය තුළ තිරසාර සංවර්ධනය වියැකී ගොස් ආකාරයක් පැහැදිලි කරගත හැකිය.අතීත ලංකාවේ පැවති තිරසාර සංවර්ධනය සහ පාරිසරික සුරක්ෂිතතාවය වර්තමානයට යොදා ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳ ව අධ්‍යනයනය කිරීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුවයි. ලෝකයේ වෙනත් ජාතීන්ට සාපේක්ෂ ව ලංකාව තුළ ප්‍රෞඪ ඉතිහාසයක් ඉතිරි කිරීමට සමත් වුණු තිරසාර සංවර්ධනය හා පාරිසරික සුරක්ෂිතතාවය වත්මනට යොදා ගත හැකි ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන අතර, මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍ර සහ ද්විතීය මූලාශ්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා නිරීක්ෂණ වැනි ක්‍රම භාවිත කරන ලදී. එමෙන්ම මෙම පර්යේෂණය තුළ කරුණු විශ්ලේෂණය කිරීමේ දී ඓතිහාසික සංසන්දනාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය හරහා අතීතය හා වර්තමානය සංසන්දනය කරමින් අතීතයේ ඒ පැවති තිරසාර සංවර්ධනය වර්තමානයේදීද යොදා ගත හැකි ආකාරය පිළිබඳව මෙහිදී අධ්‍යයනය කිරීමට අපේක්ෂිතයි. අතීතයේ පාලකයන් විසින් රට සංවර්ධන කටයුතු සිදු කර ඇත්තේ අනාගතය උදෙසා එහි පැවති පාරිසරික සුරක්ෂිතතාවයට ද හානියක් නොවන ආකාරයටය. රටේ ආර්ථිකය තුළ කෘෂි ආර්ථිකය ප්‍රමුඛයෙහි පැවති අතර, එම කටයුතු සඳහා අවශ්‍ය වාපී පද්ධතිය ඉදි කිරීමේ දී පාරිසරික සුරක්ෂිතතාවය පිළිබඳව මනා සැලකිල්ලක් දක්වා ඇති බව පෙනේ. ලංකාව තුළ බෞද්ධ ආගමික පුනර්ජීවනයක් ඇති කිරීම උදෙසා දාගැබ්,ආරාම සංකීර්ණ ඉදිකිරීමේ දී ද පාරිසරික සුරක්ෂිතතාවය හා තිරසාර සංවර්ධනය පිළිබඳ මනා අවබෝධයකින් අතීත පාලකයෝ ක්‍රියා කර තිබේ.ශ්‍රී ලංකාව තුළ වර්තමානය වන විට උද්ගත වී ඇති  දරිද්‍රතාවය, අලි මිනිස් ගැටුම වැනි සමාජ ගැටලු ද,රට තුළ තිරසාර සංවර්ධනයෙන් බැහැර ව කෙරෙන අක්‍රමවත් සංවර්ධනය සමඟ ඇති වූ පාරිසරික ගැටලු සමඟ ඒකාබද්ධ වී ඇති ආකාරයත් පැහැදිලි වේ. අතීතයේ පැවති තිරසාර සංවර්ධන සංකල්පය වර්තමානයට ගෙන අනාගතයේ රට තුළ සමාජ, ආර්ථික, හා දේශපාලන යන සෑම ක්ෂේත්‍රයකම සංවර්ධනය ඇති කිරීමට පියවර ගත යුතුය.

**ප්‍රමුඛ පද -** *තිරසාර සංවර්ධනය, පාරිසරික සුරක්ෂිතතාවය, පාලක පන්තිය, කෘෂි ආර්ථිකය, බෞද්ධ පුනර්ජීවනය*

[1] මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය. gwtsnawodi.2000@gmail.com